සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01-Circular
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2021.06.28

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කළමණාකරුවන්,

සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත.

## <u>සමෘද්ධි සහනාධාරය සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරාගැනීම.</u>

2021.06.25 දින උක්ත කරුණට අදාළව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරු, ප්‍රවර්ධන නිලධාරි හා විෂය භාර දිස්ත්‍රික් මට්ටමේ නිලධාරින් සමඟ ZOOM තාක්ෂණය ඔස්සේ සාකච්ඡා කල පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර එම ක්‍රියාවලිය කඩිනමින් ක්‍රියාවට නැංවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

I. මෙම කාර්යය 2021.07.01 දින සිට ආරම්භ කිරීමත් 2021 අගෝස්තු මස සිට එම සහනාධාර හිමිකම් ලබාගත හැකිවන පරිදි එකී දත්ත CRM පද්ධතියට ඇතුළත් කිරීමත් සිදු කල යුතුය. නැවත දැනුම් දෙන තුරු මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම 2021 පෙබරවාරි මස උපරිම සහනාධාර මුදල් වටිනාකම සැලකිල්ලට ගෙන එම මුදල් සීමාව ඉක්ම නොයන පරිදි නව සහනාධාර නිකුත් කිරීමේ බලය සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරමි. මේ වන විටත් ලබා දී ඇති සහනාධාර වටිනාකම් වල යම් සංශෝධනයක් වන්නේ නම් එම කාර්යයද සිදුකල යුත්තේ 2021 පෙබරවාරි මස උපරිම මුදල් සීමාව සැලකිල්ලට ගැනීමෙන් අනතුරුවය.

II. පදිංචිය වෙනස් වීම මත අදාළ කොට්ඨාශයෙන් ඉවත් වන හෝ පැමිණෙන ප්‍රතිලාභ වටිනාකම අනුව උපරිම මුදල් සීමාව ගලපා ගතයුතු අතර, එලෙස ඉවත් වන පවුල් වෙනුවෙන් කිසිසේත්ම නව සහනාධාර නිකුත් නොකළ යුතුය.

III. සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරාගැනීම සම්බන්ධයෙන් මා විසින් 2021.03.29 දින සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/03 හා 2021.03.17 දින දක්වා ඊට සිදුකරන ලද සියළු සංශෝධන ඇතුලත් කර නිකුත් කරන ලද උපදෙස් මාලාවට අදාළව 13 වන ඡේදයේ නව සහනාධාර නිකුත් කිරීම යටතේ සඳහන් කර ඇති පරිදි මෙම නව සහනාධාර නිකුත් කිරීම සඳහා ප්‍රතිපාදන අනුමත කර ගැනීමට මා වෙත ඉල්ලීම් කිරීමට අවශ්‍ය නොවේ.

IV. එම චක්‍රලේඛයේ 12 වන ඡේදයේ "අභියාචනා සලකා බැලීම" නම් වූ ඡේදය යටතේ ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව වසම් මට්ටමින් ලබා දීමට හැකියාව ඇති සහනාධාර වටිනාකම්වලින් 25% ක ප්‍රමාණයක් ඉදිරියේ දී සිදුකරනු ලබන අභියාචනා වෙනුවෙන් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රඳවා තබා ගත යුතු වේ.

V. තවද එහිදි ලබා දී ඇති උපදෙස් වලට අනුව සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා මේ වන විටත් මා වෙත යොමු කර ඇති ලේඛණ සම්බන්ධයෙන් ක්‍රියා කලයුතු ආකාරය වන්නේ 2021 පෙබරවාරි මසට අදාළව තම දිස්ත්‍රික්කයට වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය තුළ මෙම වැඩසටහන කළමනාකරණය කර ගැනීමයි.

VI. වර්තමානයේ අප දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවනු ලබන සමෘද්ධි සහනාධාරලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහන තවදුරටත් ශක්තිමත්ව ක්‍රියාවට නැංවීමටත්, අනතුරුව සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් ඉවත්ව යන පවුල් වෙනුවෙන් අවශ්‍යතාවය සහිත අඩුආදායම්ලාභින්, නව සහනාධාරලාභීන් ලෙස බඳවා ගැනීමටත් කටයුතු සිදුකල හැකිය.

2. මෙලෙස 2021 අගෝස්තු මස සිට නව සමෘද්ධි සහනාධාර හිමිකම් ලබන පවුල් සඳහා මෙතෙක් නිකුත් කර ඇති සමාජ ආරක්ෂණ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සිදු කල යුතු බවද කාරුණිකව දන්වන අතර, මෙම වැඩපිළිවෙල සාර්ථක කරගැනීමට සෞභාග්‍යා සතිය තුළ ඔබ සැම ලබාදෙන සහය පිළිබඳව ස්තුතිවන්ත වෙමි.

**ආර්. පී. බී. තිලකසිරි**
**අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත් :-**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය -කා.දැ.ස.
2. ලේකම්, ආර්ථික පුනර්ජීවය හා දරිද්‍රතාවය තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධන බලකාය -කා.දැ.ස.
3. රාජ්‍ය ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයංරැකියා, ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය. - කා.දැ.ස
4. විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ස.
7. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ. ක.ස.